# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1996 අංක 25 දරන විදුලි සංදේශ (විශේෂ විධිවිධාන) පනත

---

[සහතිකය සටහන් කළේ 1996 ඔක්තෝබර් මස 08 වැනි දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1996 ඔක්තෝබර් මස 11 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

මිල : ශත 60 යි. තැපැල් ගාස්තුව : රු. 2.00 යි

# 1996 අංක 25 දරන විදුලි සංදේශ (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1996 ඔක්තෝබර් මස 8 වන දින]

එල්. ඩී.—ඕ. 31/95

ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට පසුව බැඳුනු විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ ස්ථාන මාරු සහිත ඇතැම් රජයේ නිලධරයන් කෙරෙහි විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් ව්‍යාප්ත කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත, 1996 අංක 25 දරන විදුලි සංදේශ (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මාරු කිරීමේ දිනයට පෙරාතුව ම දිනයේ දී ආණ්ඩුවේ (ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ හැර) ස්ථාන මාරු සහිත සේවයකට අයත්ව සිට මාරු කිරීමේ දින සිට හෝ ඉන් පසුව සංස්ථාව විසින් සේවයේ නියුක්ත කරනු ලැබූ (මෙහි මින් මතු "අදාල නිලධරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ සෑම රජයේ නිලධරයකුම,— විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්තව සිට පසුව සංස්ථාව විසින් සේවයේ නියුක්ත කරනු ලැබූ ස්ථාන මාරුවීම් සහිත ඇතැම් රජයේ නිලධරයන්ගේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් හා සම්බන්ධ විශේෂ විධිවිධා

(අ) සංස්ථාව විසින් සේවයේ නියුක්ත කරනු ලැබූ දිනය වන විට, ඔහු විශ්‍රාම වැටුප් සහිත නිලධරයකුව සිටිමින් අවුරුදු දහයකට නොඅඩු විශ්‍රාම වැටුප් සහිත සේවයක් කර ඇති විට, ඔහු ඒ දිනයේ දී තනතුර අහෝසි කිරීමේ හේතුව මත රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගන්නා ලද නම්, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහුට ප්‍රදානය කරනු ලැබිය හැකිව තිබුණු වැටුප ලැබීමට ඔහු සුදුස්සකු වන්නේ ය;

(ආ) සංස්ථාව විසින් සේවයේ නියුක්ත කරනු ලැබූ දිනය වන විට, ඔහු විශ්‍රාම වැටුප් සහිත නිලධරයකුව සිටිමින් අවුරුදු දහයකට අඩු විශ්‍රාම වැටුප් සහිත සේවයක් කර ඇති විට, ඔහු ඒ දිනයේ දී, තනතුර අහෝසි කිරීමේ හේතුව මත රාජ්‍ය සේවයෙන් ඉවත්ව යන ලද නම්, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහුට ප්‍රදානය කරනු ලැබිය හැකිව තිබුණු ප්‍රදානය ලැබීමට ඔහු සුදුස්සකු වන්නේ ය;

(ඇ) ඔහු රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනත යටතේ පිහිටුවන ලද රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවන්නකුව සිටියේ නම්, සංස්ථාව විසින් ඔහු සේවයේ නියුක්ත කරනු ලැබූ දිනයේ දී, සේවයෙන් පහ කරනු ලැබීම නොවන වෙනත් ආකාරයකින්, ආණ්ඩුවේ කැමැත්ත ඇතිව, ඔහුගේ ශිෂ්පුම අවසන් වීමෙන් ඔහු ආණ්ඩුවේ සේවයෙන් ඉවත් වූ ලෙස, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

සංස්ථාවෙහි අදාල නිලධරයන්ගේ සේවා නියමයන් මවුත විසින් විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ භුක්ති විඳින ලද සේවා නියමයන්ට වඩා අඩු වාසිදායක නොවිය යුතු බව.

3. සෑම අදාළ නිලධරයකුම, මාරු කිරීමේ දිනයට පෙරාතුව ම දිනයේ දී ඔහු විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්ත කරනු ලැබ සිටියේ යම් කොන්දේසි හා නියමයන් මත ද ඊට වඩා අඩු වාසිදායක නොවන නියමයන් හා කොන්දේසි මත සංස්ථාව විසින් සේවයේ නියුක්ත කරනු නොලැබිය යුතු ය.

අවුරුදු අටට වැඩි එහෙත් අවුරුදු දහයට අඩු විශ්‍රාම වැටුප් සහිත සේවයක් ඇති අදාල සේවයක් විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ තනතුර දරන්නන් සේ සලකිය යුතු බව.

4. අදාල නිලධරයකු, සංස්ථාව විසින්, සේවයේ නියුක්ත කරනු ලැබූ දිනයට පෙරාතුව ම දිනයේ දී, විශ්‍රාම වැටුප් සහිත තනතුරක් බවට ප්‍රකාශ කරනු ලැබූ තනතුරක් දරමින් සිටියා වූ ද, එම දිනයේ දී අවුරුදු දහයට අඩු එහෙත් අවුරුදු අටකට නොඅඩු සේවයක් කර තිබුණා වූ ද අවස්ථාවක—

(අ) ආණ්ඩුව යටතේ ඒ නිලධරයාගේ විශ්‍රාම වැටුප් සහිත සේවයෙහි එකතුව අවුරුදු දහයක් බවට පත් වන්නේ (එම එකතුව ගණන් බැලීමේ කාර්ය සඳහා සංස්ථාව යටතේ සේවය ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් සහිත සේවයක් ලෙස ගණන් ගනු ලැබේ.) යම් සේවා කාලසීමා වක් එකතු කළ විට ද ඒ කාලසීමාව, ඒ නිලධරයා, සංස්ථාව විසින් ඔහු සේවයේ නියුක්ත කරවනු ලැබූ දිනයට පෙරාතුව ම දිනයේ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ දැරූ තනතුරම දරන්නාක් සේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්ය සඳහා පමණක් සලකනු ලැබිය යුතු ය;

(ආ) ඒ අදාළ නිලධරයා සංස්ථාව විසින් සේවයේ නියුක්ත කරනු ලැබූ දිනයට පෙරාතුව ම දිනයේ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ දැරූ තනතුරම දරන්නාක් සේ, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්ය සඳහා සල කනු ලබන සේවා කාලසීමාව තුළ සෑම සම්පූර්ණ මාසයක් වෙනුවෙන් ම, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණයක් ඒකාබද්ධ අරමුදලට බැර කිරීම පිණිස, සංස්ථාව විසින් සංස්ථාවේ අරමුදලින් ඒ නිලධරයා වෙනුවෙන්, භාණ්ඩා ගාරයේ ලේකම්වරයා වෙත ගෙවනු ලැබිය යුතු ය;

(ඇ) (අ) ඡේදයේ සඳහන් කාලසීමාව අවසානයේ, ඔහු රජයේ සේවයෙන් විශ්‍රාම ගත් ලෙස සැලකිය යුතු අතර, ඒ කාලසීමාව අවසානයේ දී තනතුර අහෝසි කිරීමේ හේතුව මත රජයේ සේවයෙන් විශ්‍රාම ගන්නා ලද නම් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහුට ප්‍රදානය කරනු ලැබිය හැකිව තිබුණු විශ්‍රාම වැටුප සඳහා ඔහු සුදුස්සකු වන්නේ ය.

විශ්‍රාම වැටුප් ගෙවීම යනාදිය.

5. 2 වන වගන්තියේ පටහැනිව කමක් සඳහන් වී තිබුණ ද අදාල නිලධරයකු—

(අ) සංස්ථාව විසින් සේවයේ නියුක්ත කරනු ලැබූ දිනයේ දී ඒ වගන්තිය යටතේ විශ්‍රාම වැටුපක් සඳහා සුදුස්සකු බවට පත්ව, ඔහුගේ සම්පූර්ණ විශ්‍රාම වැටුප ලැබීමට මනාපය පළකළහොත්, සංස්ථාවෙහි ඔහු සේවයේ නියුක්තව සිටින කාලසීමාව තුළ ඔහුට එම විශ්‍රාම වැටුප ගෙවනු නොලැබිය යුතු ය;

(ආ) ඒ වගන්තිය යටතේ විශ්‍රාම වැටුපක් සඳහා සුදුස්සකු බවට පත්ව, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2අ වගන්තියේ (1) වන උප වගන්තියේ (i) ඡේදයේ විධිවිධානවලට අනුකූලව ඔහුගේ විශ්‍රාම වැටුපෙන් හතරෙන් එක් කොටසක් ලෙස අර්ධ ආගණනය කළ පාරිතෝෂිකයක් ලැබීමට මනාපය පළකළහොත්—

(i) එම පාරිතෝෂිකය ඔහුට නොගෙවිය යුතු අතර එය සංස්ථාවේ අනුමත කළ අර්ථ සාධක අරමුදලක් ඔහුගේ ගිණුමට බැර කළ යුතු ය;

(ii) ඉහත කී ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහුට ගෙවිය යුතු විශ්‍රාම වැටුපේ ඉතිරි හතරෙන් තුනක කොටස, ඔහු සංස්ථාවේ සේවයේ නියුක්ත කාල සීමාව තුළ ඔහුට ගෙවනු නොලැබිය යුතු ය;

(iii) ඉහත කී ව්‍යවස්ථා සංග්‍රහයේ 2අ වගන්තියේ (1) උපවගන්තියේ (ii) ඡේදයේ සඳහන් "ඔහු විශ්‍රාම ගත් දිනයේ සිට අවුරුදු දහයක" කාල සීමාව ගණන් බැලීමේ කාර්යය සඳහා, ඔහු සංස්ථාවේ සේවයේ නියුක්තව සිටින අවසාන දිනය ඔහු විශ්‍රාම ගන්නා දිනය ලෙස සැලකිය යුතු ය;

(ඇ) විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුපකට නොව පාරිතෝෂිකයක් සඳහා ඒ වගන්තිය යටතේ සුදුසුකම් ලැබුවහොත්, ඒ පාරිතෝෂිකය ඔහුට නොගෙවිය යුතු අතර, එය සංස්ථාවේ අනුමත කළ අර්ථසාධක අරමුදලක ඔහුගේ ගිණුමට බැර කළ යුතු ය; සහ

(ඈ) රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනත යටතේ යම් මුදල් ප්‍රමාණයක් ලැබීම සඳහා ඒ වගන්තිය යටතේ සුදුසුකම් ලැබුවහොත්, ඒ මුදල ඔහුට නොගෙවිය යුතු අතර, එය සංස්ථාවේ අනුමත කළ අර්ථසාධක අරමුදලක ඔහුගේ ගිණුමට බැර කළ යුතු ය.

**6.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

අර්ථ නිරූපණය.

7. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"සංස්ථාව" යන්නෙන්, 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 2 වන වගන්තිය යටතේ කරන ලදුව 1990 පෙබරවාරි මස 06 වන දින හා අංක 596/11 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය අදහස් වේ.

"මාරු කිරීමේ දිනය" යන්නෙන්, 1991 සැප්තැම්බර් මස 01 වන දිනය අදහස් වේ.